# විශ්වවිද්‍යාලයෙන් දෙනු ලබන පර්යේෂණ ප්‍රතිපාදන අයදුම් කිරීම සඳහා මාර්ගෝපදේශ

1. කැලණිය විශ්වවිද්‍යාලය මගින් ප්‍රදානය කරනු ලබන පර්යේෂණ ප්‍රතිපාදන වලට අයදුම් කිරීම සඳහා නිර්ණායක පහත පරිදි වේ.

| තනතුර | ප්‍රතිපාදන කාල සීමාව | |
|---|---|---|
| | අවම | උපරිම |
| කථිකාචාර්ය (පරිවාස) | මාස 06 | අවුරුදු 03ක් දක්වා හෝ පරිවාස කාලය අවසන් වන දිනය දක්වා |
| අනෙකුත් සියලු අධ්‍යයන කාර්ය මණ්ඩලය | මාස 06 | අවුරුදු 03 |

අයදුම්කරුවෙක් විසින් එක් වරකට ඉල්ලුම් කළ හැක්කේ එක් පර්යේෂණ ප්‍රතිපාදනයක් සඳහා පමණක් වන අතර එහි උපරිම ප්‍රතිපාදන සීමාව රු.500,000.00 කි. පර්යේෂණ ප්‍රතිපාදන සඳහා වෙන් කරනු ලබන මුදල රු.300,000.00 ත් රු.500,000.00 ත් අතර නම් මුල් අවස්ථාවේදී රු.300,000.00ක මුදලක් අනුමත කරන අතර ඉතිරි මුදල පර්යේෂණ ව්‍යාපෘතියේ ප්‍රගතිය මත ප්‍රදානය කරනු ලැබේ.

2. විශ්වවිද්‍යාල පර්යේෂණ ප්‍රතිපාදන දෙනු ලබන්නේ බහුවිධ පර්යේෂණ, අන්තර් විනය, මූලික ව්‍යවහාරික, කර්මාන්ත නැඹුරු, සමාජ ප්‍රතිලාභ පර්යේෂණ සඳහා ය.

3. පර්යේෂණ ප්‍රතිපාදන සඳහා අයදුම්පත්‍ර පිළියෙල කිරීමේදී පර්යේෂණ හා ප්‍රකාශන අංශය මගින් නියම කර ඇති ආකෘතිය අනුව පිළියෙල කළ යුතු ය.

4. අදාල ආචාර්යවරයා පශ්චාත් උපාධියක් සම්පූර්ණ කළ අයෙකු වීම සහ අඛණ්ඩව පර්යේෂණ කටයුතු සිදු කර තිබීම අපේක්ෂා කෙරේ. අයදුම්කරු පශ්චාත් උපාධියක් නොමැති කථිකාචාර්යවරයෙක් (පරිවාස) නම්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය (II ශ්‍රේණිය) හෝ ඊට ඉහළ තනතුරක් දරන විශ්වවිද්‍යාලයේ ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයෙක්, අධීක්ෂකවරයෙක් ලෙස නම් කළ යුතු ය.

5. පර්යේෂණ ප්‍රතිපාදන මුදල රු.300,000.00 ට වඩා අඩු අයදුම්පත්‍ර අදාල පීඨයේ පීඨාධිපති විසින් පීඨ සභාවෙන් නම් කරන ඇගයුම්කරුවෙකු වෙත ඇගයීම සඳහා යොමු කරනු ලැබේ. පර්යේෂණ ප්‍රතිපාදන මුදල රු.300,000.00 ට වඩා වැඩි අයදුම්පත්‍ර පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව විසින් නිර්දේශ කරනු ලබන භාහිර ඇගයුම්කරුවෙකු වෙත යොමු කරනු ලැබේ.

6. ප්‍රතිපාදන සම්බන්ධ සියලු තාක්ෂණික සහ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පර්යේෂණය සිදු කරන ආචාර්යවරයා වග කිව යුතු ය.

7. අයදුම්පත්‍රය අනුමත වූ පසු අදාල ආචාර්යවරයා සහ කැලණිය විශ්වවිද්‍යාලය අතර ගිවිසුමක් අත්සන් කිරීම අනිවාර්ය වේ.

8. ගිවිසුම් අත්සන් කිරීමෙන් පසු අදාල ආචාර්යවරයා හෝ අධීක්ෂකවරයා මාස 06ක් හෝ ඊට වැඩි කාලයකට පර්යේෂණය කරගෙන යාමට අපොහොසත් වුවහොත් ඔහු/ඇය ඒ සඳහා වෙනත් ආචාර්යවරයෙක් පත් කළ යුතු ය.

9. අදාල ආචාර්යවරයාට නොවැළැක්විය හැකි හේතුවක් මත ක්‍රියාකාරී සැලැස්මෙන් බැහැර වීමට සිදු වුවහොත් ඒ පිළිබඳ දන්වා ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතු ය.

10. පර්යේෂණ කාල සීමාව දීර්ඝ කර ගැනීමේදී එක් වරකට මාස 12ක උපරිමයකට යටත්ව පහත සීමාවන් යටතේ ඒ සඳහා ඉල්ලීම් ඉදිරිපත් කළ හැක.

| අයදුම්පත්‍රයේ සඳහන් කාලසීමාව | උපරිම කාල සීමාව (දීර්ඝ කරන කාල සීමාව ද ඇතුලත්ව) |
|---|---|
| වසර 01 | වසර 02 |
| වසර 02 | වසර 04 |
| වසර 03 | වසර 05 |

11. නියමිත පර්යේෂණය සිදු කරගෙන යාමට නොහැකි අවස්ථාවකදී ප්‍රතිපාදන කාල සීමාව අවසන් වන තෙක් නොසිට ඒ පිළිබඳ පර්යේෂණ හා ප්‍රකාශන අංශය දැනුවත් කළ යුතු ය.

12. අවසන් වාර්තාව සම්පූර්ණ කිරීම සහ නොපියවූ අත්තිකාරම් මුදල් පියවීම සඳහා පර්යේෂණ කාල සීමාව අවසන් වන දින සිට මාස 03ක කාලයක් දෙනු ලැබේ. නමුත් අවසන් වාර්තාව හෝ සඟරා මුද්‍රණය කිරීම සඳහා වැය වන වියදම් පියවීම එම මුද්‍රණ කටයුතු අවසන් වූ පසු සිදු කළ හැක.

13. අදාල ආචාර්යවරයා විසින් අවසන් වාර්තාව නියමිත ආකෘතිය අනුව ඉදිරිපත් කල යුතු අතර මුදල් අත්තිකරම් පියවීම පර්යේෂණය සම්පූර්ණ කර මාස 03ක් ඇතුලත සිදු කල යුතු ය. මෙහිදී පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව විසින් අවසන් වාර්තාව අනුමත කරන දිනය, පර්යේෂණය සම්පූර්ණ කරන දිනය ලෙස සලකනු ලැබේ.

14. විශ්වවිද්‍යාලයේ ප්‍රතිපාදන වලින් සිදු කරන ලද පර්යේෂණයක් ප්‍රකාශයට පත් කර ඇත්නම් හෝ සඟරාවක පළ කිරීම සඳහා අනුමත කර ඇත්නම්, එහි විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රතිපාදන පිළිබඳ සඳහන් කල යුතු අතර එය අවසන් වාර්තාව වෙනුවට ඉදිරිපත් කළ හැක.

15. අවශ්‍ය අවස්ථාවකදී, අදාල ආචාර්යවරයා ආචාරධර්ම සමාලෝචනයක් සිදු කළ යුතු ය.

16. අදාල ආචාර්යවරයා හිමිකාරිත්වය, බුද්ධිමය දේපල, කොල්ලකෑම සහ පර්යේෂණ සොයාගැනීම් ප්‍රකාශයට පත් කිරීමේ භාවිතයන් සම්බන්ධ ජාතික මාර්ගෝපදේශ සහ රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතු ය.

17. අදාල ආචාර්යවරයා විසින් අර්ධ වාර්ෂික ප්‍රගති වාර්තා නියමිත ආකෘතිය අනුව ඉදිරිපත් කළ යුතු ය. එම ප්‍රගති වාර්තා අදාල අධ්‍යයනාංශයේ අංශ ප්‍රධාන හා පීඨාධිපති මගින්, නියමිත මාස 06ක කාලය අවසන් වන දින සිට මාසයක් තුල පර්යේෂණ හා ප්‍රකාශන අංශයට යොමු කළ යුතු ය.

18. විශ්වවිද්‍යාලයේ ප්‍රතිපාදන වලින් සිදු කරන ලද පර්යේෂණයක් ප්‍රකාශයට පත් කර ඇත්නම් හෝ සඟරාවක පළ කිරීම සඳහා අනුමත කර ඇත්නම්, එහි විශ්වවිද්‍යාලයීය පර්යේෂණ ප්‍රතිපාදන පිළිබඳ සඳහන් කල යුතු අතර එය අවසන් වාර්තාව වෙනුවට ඉදිරිපත් කළ හැක.

19. පර්යේෂණ ප්‍රතිපාදන රු. 300,000.00 ට වඩා වැඩි නම් පර්යේෂණය සම්පූර්ණ කර වසර 5ක් තුල ඒ සම්බන්ධ ප්‍රකාශනයක් සගරාවක පළ කල යුතු ය. ඉදිරියේදී පර්යේෂණ ප්‍රතිපාදන ප්‍රදානය කිරීමේදී මෙය අනිවාර්යයෙන් සලකා බලනු ලැබේ.

20. පර්යේෂණ ප්‍රතිපාදන ලබා ගන්නා සියලුම ආචාර්යවරුන් සිය පර්යේෂණයට අදාල සොයාගැනීම් ප්‍රතිපාදන කාල සීමාව තුල (හෝ මාස 12කට වඩා අඩු නම් පර්යේෂණය සම්පූර්ණ කර මාස 06ක් තුල), විශ්වවිද්‍යාලය මගින් සංවිධානය කරන සම්මන්ත්‍රණයකට ඉදිරිපත් කල යුතු ය. ඒ පිළිබඳ ප්‍රගති වාර්තාවේ සඳහන් කළ යුතු ය.

21. අනුමත කාලය තුලදී පර්යේෂණ ව්‍යාපෘතිය අවසන් කිරීමට නොහැකි වුවහොත් එය ගිවිසුම් කඩ කිරීමක් ලෙස සැලකේ. පර්යේෂකවරයා විසින් ලබා ගත් පර්යේෂන ප්‍රතිපාදන 15% පොළී අනුපාතයක් සමග නැවත විශ්වවිද්‍යාලයට අය කර ගනු ලැබේ. එහෙත් පර්යේෂකවරයා විසින් පර්යේෂණය කරගෙන යාමට නොහැකි හේතුන් (පර්යේෂකයාගේ පාලනයෙන් තොරව) ඉදිරිපත් කරන්නේ නම් පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව මගින් ඒ පිළිබඳ සොයා බැලීම සඳහා ජ්‍යෙෂ්ඨ ආචාර්යවරු තිදෙනෙක්ගෙන් සමන්විත කමිටුවක් පත් කරනු ලැබේ.

22. නියමිත කාල සීමාව තුල පර්යේෂණය සාර්ථකව අවසන් කර නොමැති නම් (දීර්ඝ කරන ලද කාලය ද ඇතුලුව) එය ගිවිසුම් කඩ කිරීමක් ලෙස සැලකේ. එලෙස ගිවිසුම් කඩ කිරීමක් සිදු වී ඇත්නම් ඉදිරි වසර 03ක කාලයක් සඳහා පර්යේෂණ ප්‍රතිපාදන ප්‍රදානය සඳහා සලකා බලනු නොලැබේ.

23. පර්යේෂණ හා ප්‍රකාශන කමිටුව මගින් අවසන් වාර්තාව අනුමත කල පස එම පර්යේෂනය සම්පූර්ණ පර්යේෂණ ව්‍යාපෘතියක් සේ සැලකේ.